සැ. යු.-2011.04.21 දින පළ වූ අංක 1,703 දරන ගැසට් පත්‍රයේ I – III සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,704 - 2011 අප්‍රේල් මස 29 වැනි සිකුරාදා - 2011.04.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 585 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 මැයි මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 අප්‍රේල් මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

583- B 80219— 8,825 (2011/04)
B1-

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**ඉංජිනේරු තාක්ෂණ ආයතනය (පෙර තාක්ෂණඥයින් පුහුණු කිරීමේ ආයතනය) - කටුනායක**

***ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම - 2011 කණ්ඩායම***

කටුනායක, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ (පෙර තාක්ෂණඥයින් පුහුණු කිරීමේ ආයතනය) ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව, 2011 කණ්ඩායම සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම පිණිස ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :*

පහත දක්වා ඇති සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

1.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී විද්‍යාව, ගණිතය සහ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 06කින් සාමාර්ථය ලබා සිටීම ; සහ

1.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ - නව නිර්දේශය) විභාගයේ දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් තුන (03) එකවර සමත්වීම.

2. *වයස.-* 2011.12.01 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 25ට නොවැඩි විය යුතු ය.

3. *පුහුණු කිරීමේ කාලය පිළිබඳ වැඩසටහන් විස්තර :*

මෙම පාඨමාලාවේ කාලය වසර හතරකි. මාස 18ක න්‍යායික උපදෙස් පාඨමාලාව, මාස 30ක ප්‍රායෝගික පුහුණුව සමග පහත දැක්වෙන ආකාරයට සකස් කර ඇත.

| | |
|---|---|
| මූලික උපදෙස් වැඩසටහන<br>ඉංජිනේරු තාක්ෂණ (ඉ.තා.) ආයතනයේ දී | - මාස 06 |
| මූලික ආයතනික ක්ෂේත්‍ර පුහුණුව<br>කර්මාන්ත ආයතනයේ දී | - මාස 12 |
| සාමාන්‍ය උපදෙස් වැඩසටහන<br>ඉ. තා. ආයතනයේ දී | - මාස 06 |
| සාමාන්‍ය ආයතනික ක්ෂේත්‍ර පුහුණුව<br>කර්මාන්ත ආයතනයේ දී | - මාස 12 |
| විශේෂ උපදෙස් වැඩසටහන<br>ඉ. තා. ආයතනයේ දී | - මාස 06 |
| විශේෂ ආයතනික ක්ෂේත්‍ර පුහුණුව<br>කර්මාන්ත ආයතනයේ දී | - මාස 06 |

මෙම ඉංජිනේරු පාඨමාලාවට අයත් න්‍යායික උපදෙස් හා පාඨමාලා ප්‍රායෝගික කාර්යයන් මෙම ආයතනයේ දී ලබා දෙන අතර ආයතනික ක්ෂේත්‍ර පුහුණුව පිළිගත් කර්මාන්ත ආයතන මගින් ලබා දෙනු ඇත.

පාඨමාලාව ආරම්භ කිරීමට ප්‍රථම පැය 100ක කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාවක් පවත්වනු ලබන අතර එයට තෝරාගත් සියලුම ආධුනිකයින්ගේ සහභාගිත්වය අනිවාර්ය වේ.

4. ආයතනය මගින් පවත්වනු ලබන පාඨමාලා පහත සඳහන් පරිදි වේ :-

*(අ) සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය :*

1. ගොඩනැගිලි හා ව්‍යුහ ඉංජිනේරු පාඨමාලාව
2. මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉංජිනේරු පාඨමාලාව
3. ජල හා පාරිසරික ඉංජිනේරු පාඨමාලාව

*(ආ) විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රය :*

1. විද්‍යුත් ඉංජිනේරු පාඨමාලාව
2. විදුලිබල ඉංජිනේරු පාඨමාලාව
3. විදුලි සංදේශ ඉංජිනේරු පාඨමාලාව

*(ඇ) යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රය :*
1. යාන්ත්‍රික (ස්වයංචලන) ඉංජිනේරු පාඨමාලාව
2. යාන්ත්‍රික (සාමාන්‍ය) ඉංජිනේරු පාඨමාලාව
3. නාවික ඉංජිනේරු පාඨමාලාව

*(අ)* ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ නාවික ඉංජිනේරු පාඨමාලාව (අංක 9) තත්ත්ව කළමනාකරණ පද්ධතිය ISO 9001-2008 හි දක්වා ඇති අවශ්‍යතා පරිදි පැවැත්වේ.

*(ආ)* නාවික ඉංජිනේරු පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ අන්තර්ජාතික සමුද්‍ර සංවිධානයේ STCW-95 සහ 7.04 ආදර්ශ පාඨමාලාව හා සම්බන්ධිත නාවික ඉංජිනේරු කාරක මට්ටමේ දැනුම, අවබෝධය සහ ප්‍රවීණතාව පිළිබඳ විධානානුකූල අවශ්‍යතා සපුරාලනු පිණිස වේ.

5. *උපදෙස් මාධ්‍යය.*- මෙම පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි භාෂාවෙනි.

6. *ආධුනිකත්ව ගිවිසුම* -

6.1 තෝරාගනු ලබන සෑම ආධුනිකයෙකු විසින්ම ආධුනිකයා, ඉංජිනේරු තාක්ෂණ ආයතනය සහ පුහුණු කිරීමේ ආයතනය යන තිදෙනා වෙතම අන්‍යෝන්‍ය වගකීම් පැවරෙන විශේෂ ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේ දී, පාඨමාලාව අවසානයේ ආපසු ගෙවනු ලබන රුපියල් 5,000ක තැන්පතු මුදලක් ලබා දිය යුතු ය. පාඨමාලාව අතරමග හැර යන සිසුන්ට මෙම මුදල ආපසු ගෙවනු නොලැබේ.

6.2 කර්මාන්ත පුහුණු අවස්ථාවල දී ආධුනිකයා සහ පුහුණු ආයතනය අතර ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

6.3 පුහුණුව අවසාන වීමෙන් පසුව ආධුනිකයින් සඳහා රැකියා සැපයීමට ආයතනය බැඳී නොමැත.

6.4 මෙම පාඨමාලා සඳහා ලියාපදිංචිවන සියලුම සිසුන් මුළු පාඨමාලා කාලය තුළ 80% අවම පැමිණීමේ ප්‍රතිශතයක් පවත්වාගෙන යා යුතු ය. එසේ නොවන අවස්ථාවල දී අදාල විභාගවලට පෙනී සිටිය නොහැකි අතර ඔවුන්ට එම කණ්ඩායමෙන් ඉවත්වී පසු කණ්ඩායම සමග අධ්‍යයන කටයුතු කිරීමට සිදුවේ.

7. *සහතික ප්‍රදානය.*- සාර්ථක ලෙස පුහුණුව අවසන් කර සමත්වන ආධුනිකයින් හට ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ඇත.

8. *තෝරාගැනීමේ ක්‍රමය :*

8.1 ඉහත අංක 1 ඡේදයෙහි සඳහන් ඇතුළත් කරගැනීම සඳහා වූ අවම සුදුසුකම් සහිත අංක 2 ඡේදයෙහි සඳහන් වයස් සීමාව තුළ වූ අයැදුම්කරුවන්ගෙන් පහත දැක්වෙන ක්‍රමයට තෝරාගැනීම සිදුකරනු ලැබේ.

8.2 මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අයැදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් වූ ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. (ලිඛිත යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන සියලුම අයැදුම්කරුවන් වෙත කල්වේලා ඇතිව ඒ බව දැනුම් දෙනු ලැබේ).

8.3 ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු හා සම්මුඛ පරීක්ෂණයක් මගින් විවිධ ක්ෂේත්‍ර/විශේෂීකරණ සඳහා ආධුනිකයින් තෝරාගනු ඇත.

8.4 නාවික ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා තෝරාගනු ලැබූ අයැදුම්කරුවන් ඔවුන් එම ක්ෂේත්‍රයේ ලියාපදිංචි වීමට පෙර ඔවුන්ගේ වියදමින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

9. *අයැදුම්පත් :*

9.1 අයැදුම්පත් සහ ආයතනය පිළිබඳ වැඩි විස්තර www.iet.edu.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක; තව ද,

9.2 කටුනායක, පන්සල පාරේ, ඉංජිනේරු තාක්ෂණ ආයතනයට පැමිණ රු. 100ක් ගෙවීමෙන් හෝ තැපෑලෙන් අවශ්‍ය නම් රු. 100ක් වටිනා මුදල් ඇණවුමක් සහ රු. 5ක් වටිනා මුද්දර ගැසූ ලිපිනය ලියන ලද අඟල් 9x4 ප්‍රමාණයේ ලියුම් කවරයක් ලේඛකාධිකාරි, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක (දුරකථන අංක 011-2252833, 011-2252834) යන ලිපිනයට එවීමෙන් 2011 ජූනි මස 18 වැනි දින දක්වා අයැදුම්පත් ලබාගත හැක. මුදල් ඇනවුම් : ගණකාධිකාරි, ඉංජිනේරු තාක්‍ෂණ ආයතනය නමින් ලබාගතයුතු අතර ගෙවීම් කරන තැපැල් කාර්යාලය 'කටුනායක' විය යුතුයි.

9.3 මෙයට අමතරව පහත දැක්වෙන කාර්යාලවලට පැමිණ රු. 100ක් ගෙවීමෙන් ද, 2011 ජූනි මස 18 වැනි දින දක්වා අයැදුම්පත් මිල දී ගත හැක.

(i) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.
*දුරකථනය :* 011-2863680, 011-2867435

(ii) ආධුනිකත්ව අභ්‍යාස ආයතනය, අංක 581, ගාලුපාර, කටුබැද්ද, මොරටුව.
*දුරකථනය :* 011-2647393, 011-2641092

(iii) මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, 07,දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය.
*දුරකථනය :* 011-2572977, 011-2532182

(iv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, කොළඹ බස්නාහිර දිස්ත්‍රික් කාර්යාලය, අංක 242, හැව්ලොක් පාර, කොළඹ 05.
*දුරකථනය* : 011-2597671, 011-2587258

(v) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 56, ආනන්ද මාවත, ගම්පහ.
*දුරකථනය* : 033-2227501

(vi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, පුත්තලම දිස්ත්‍රික් කාර්යාලය, මෝල වත්ත, මාදම්පෙ.
*දුරකථනය* : 032-2248250

(vii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය, A/6 මහවැලි නිල නිවාසය, නව නගරය, පොළොන්නරුව.
*දුරකථනය* : 027-2223023

(viii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මොණරාගල දිස්ත්‍රික් කාර්යාලය, කච්චේරි සංකීර්ණය, මොණරාගල.
*දුරකථනය* : 055-2276504

(ix) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මාතලේ දිස්ත්‍රික් කාර්යාලය පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 11, පන්සල පාර, මණ්ඩන්ඩාවල, මාතලේ.
*දුරකථනය* : 066-2223173

(x) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය, විද්‍යාල මාවත, නව නගරය, රත්නපුර.
*දුරකථනය* : 045-2228667

(xi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය, 27ඒ, විවෘත විශ්ව විද්‍යාල මාවත, නූපේ, මාතර.
*දුරකථනය* : 041-2226958

(xii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය, අංක 34, මිහිඳු මාවත, තංගල්ල.
*දුරකථනය* : 047-2241512

(xiii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාර්යාලය, අංක 57, තැපැල් කාර්යාල පාර, ත්‍රිකුණාමලය.
*දුරකථනය* : 026-2221709

(xiv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, යාපනය/මුලතිව් දිස්ත්‍රික් කාර්යාලය, අංක 07, පන්සල පාර, යාපනය
*දුරකථනය* : 021-2222383

(xv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මන්නාරම දිස්ත්‍රික් කාර්යාලය, කෙලින් වීදිය, මන්නාරම.
*දුරකථනය* : 034-3942823

(xvi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය, ගාලු පාර, බේරුවල.
*දුරකථනය* : 034-2279710

(xvii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය, මීගමුව පාර, මල්කඩුවාව, කුරුණෑගල.
*දුරකථනය* : 037-2223789

(xviii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අනුරාධපුරය දිස්ත්‍රික් කාර්යාලය, ගුවන්තොටුපල පාර, අනුරාධපුරය.
*දුරකථනය* : 025-2223178

(xix) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය, අංක 288 කුමාරසිංහ මාවත, පස්සර පාර, බදුල්ල.
*දුරකථනය* : 055-2222608

(xx) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මහනුවර දිස්ත්‍රික් කාර්යාලය, අංක 108/2බී, තිවංක බෝධි මාවත, මහනුවර.
*දුරකථනය* : 081-2201918

(xxi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය, අංක 05, කෘෂිකර්ම මාවත, හාවා එළිය, නුවරඑළිය.
*දුරකථනය* : 052-2223702

(xxii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය, අංක 440, නුවර පාර, මීපිටිය කෑගල්ල.
*දුරකථනය* : 035-2223127

(xxiii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය, උඩවත්ත, බද්දේගම
*දුරකථනය* : 091-5677388

(xxiv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අම්පාර දිස්ත්‍රික් කාර්යාලය, අංක 06, ජී. එස්. පටුමග, කල්මුනිකුඩයි 13, කල්මුනෙ.
*දුරකථනය* : 067-2229357

(xxv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලය, 16/1 නව කල්මුනෙයි පාර, මඩකලපුව

(xxvi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, වවුනියාව දිස්ත්‍රික් කාර්යාලය, රාජදුරෙහයි පාර, වෛරවපුලියන්කුලම, වවුනියාව.
*දුරකථනය* : 024-2220442

9.4 සෑම අයදුම්කරුවෙකු විසින්ම තම අයදුම්පත ඉදිරිපත් කිරීමේ දී නැවත නොගෙවන රු. 500ක මුදලක් (9.5 ප්‍රකාර) ගෙවිය යුතු ය. මෙම මුදල දිවයිනේ පිහිටි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවිය හැකි ය.

9.5 මුදල් තැන්පතු තුණ්ඩුව පහත සඳහන් කරුණු සහිතව නිසි පරිදි සම්පූර්ණ කළ යුතු ය :-

(i) *ශාඛා අංකය සහ ගිණුම් අංකය* : 276-1-001-2-4535909.

(ii) *බැර උපදෙස්.-* මහජන බැංකුව, කටුනායක, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ රැස් කිරීමේ ගිණුම් අංක 276-1-001-2-4535909 ට බැර පිණිස.

(iii) අයදුම්කරුගේ නම සහ ලිපිනය.

9.6 අයදුම්පත වෙබ් අඩවියෙන් ලබාගන්නා අයදුම්කරුවන් විභාග ගාස්තු ලෙස රු. 600ක් ගෙවිය යුතුවේ.

9.7 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, මුදල් ගෙවීම් කරන ලද බැංකු ශාඛාවේ බලයලත් නිලධාරියෙකු විසින් සහතික කරන ලද තැන්පතු රිසිට්පත, අයදුම්පත සමග අමුණා 2011 ජුනි මස 18 වැනි දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ/විදුහල්පති, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක යන ලිපිනයට එවිය යුතු ය. කවරයේ වම්පස කෙළවරේ "විශේෂ ආධුනිකයන් බඳවා ගැනීම - 2011 අයදුම්පත " ලෙස සටහන් කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හෝ අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**9.8 රජයේ කාර්මික ආයතනයක හෝ විශ්වවිද්‍යාලයක පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ උපාධිය හැදෑරූ හෝ හදාරමින් සිටින අයට මේ සඳහා අයදුම්කළ නොහැක.**

9.9 අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් හෝ ඡායා පිටපත් එවිය යුතු නැත.

9.10 අයදුම්පත් ලැබුණු බවට අයදුම්කරුවන්ට දැනුම් දෙනු නොලැබේ.

10. තැපෑලේ දී නැතිවන හා ප්‍රමාදවන අයදුම්පත් සම්බන්ධයෙන් ඉංජිනේරු තාක්ෂණ ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා කල් ඇතිව සිය අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ.

සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

අංක 971,ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ,
රාජගිරිය.

For Office use
(AP No)

For Office Use
(Index No.)

**ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය**

NATIONAL APPRENTICE AND INDUSTRIAL TRAINING AUTHORITY

*ඉංජිනේරු තාක්ෂණ ආයතනය - කටුනායක*
Institute of Engineering Technology - Katunayake
(Former Technician Training Institute)

ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම - 2011 කණ්ඩායම *අයදුම් පත්‍රය*
APPLICATION FOR THE RECRUITMENT OF SPECIAL APPRENTICES IN ENGINEERING FOR NATIONAL DIPLOMA IN ENGINEERING SCIENCES (NDES) COURSE - 2011 BATCH

1. සම්පූර්ණ නම/Name in Full :

2. මුලකුරු සමඟ නම/Name with Initials :

3. ලිපිනය /Address :

3. (i) දුරකථන අංකය/Telephone No.:

4. දිස්ත්‍රික්කයඃ /District :

5. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයඃ/Divisional Secretariat :

6. උපන් දිනය Date of Birth : දිනය Date මාසය Month වර්ෂය Year

7. ස්ත්‍රී/පුරුෂ භාවය : Sex : (M/F)

8. ජාතික හැඳුනුම්පත් අංකය/ National Identity Card No. :

9. අධ්‍යාපන සුදුසුකම් / Educational Qualifications :

(i) අ. පො. ස (සා. පෙ)/GCE O/L
එකම වසරක දී සමත් වූ විෂයයන්/
Subjects Passed at one and same sitting :

වර්ෂය/Year

විභාග මධ්‍යස්ථානය/
Examination Centre :

විභාග අංකය/Index No.

| | විෂයය *Subject* | සාමාර්ථය *Grade* |
|---|---|---|
| 1 | ගණිතය/Mathematics | |
| 2 | විද්‍යාව/Science | |
| 3 | භාෂාව/Language | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |
| 11 | | |
| 12 | | |

9. (ii) අ. පො. ස (උ. පෙළ) සමත්වූ විෂයයන් / G. C. E. (A/L) Subjects passed in one sitting

වර්ෂය/Year    විභාග මධ්‍යස්ථානය/Examination Centre :

විභාග අංකය/Index No. :

සාමාන්‍ය Z ලකුණු/Average Z Score :

| *විෂයය Subject* | *සංයුක්ත ගණිතය Combined Maths* | *භෞතික විද්‍යාව Physics* | *රසායන විද්‍යාව Chemistry* |
|---|---|---|---|
| *සාමාර්ථය Grade* | | | |

9. (iii) අ. පො. ස. (උ. පෙළ) සඳහා පෙනී සිටි වාර සංඛ්‍යාව :
Number of sittings for GCE A/L Exam. :

10. කැමැත්තේ අනුපිළිවෙලට විශේෂිත ක්ෂේත්‍ර වර්ගීකරණය :
(කැමැත්ත අනුපිළිවෙලට 1 සිට 09 දක්වා ලකුණු කරන්න.)

Order of Preference of fields of Specialization :
(Mark from 1 to 09 based on order of preference)

| *Se. No.* | *Field* | *Code* | *Preferences* |
|---|---|---|---|
| 1 | Building and Structural Engineering | CB | |
| 2 | Highway and Railway Engineering | CH | |
| 3 | Water and Environmental Engineering | CW | |
| 4 | Electronics Engineering | EE | |
| 5 | Electrical Power Engineering | EP | |
| 6 | Telecommunication Engineering | ET | |
| 7 | Mechanical (Automotive) Engineering | M A | |
| 8 | Mechanical (General) Engineering | M G | |
| 9 | Marine Engineering | M M | |

11. මුදල් ගෙවූ රිසිට්පත මෙහි අලවන්න.
Stick paying Receipt

මෙම ඉල්ලුම් පත්‍රයෙහි සපයා ඇති විස්තර දැන්වීමෙහි සඳහන් සුදුසුකම්වලට අනුකූල බව ද, සත්‍ය හා නිවැරදි බව ද, මම විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ අධ්‍යාපන ආයතනයක පූර්ණ කාලීන උපාධි හෝ ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා ලියාපදිංචි වී නැති බව ද සනාථ කරමි. මෙහි ඇතුළත් යම්කිසි තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව සනාථ වුවහොත් මෙම පුහුණු පාඨමාලාවට තෝරා ගැනීමෙන් පසුව වුව ද කිසිම මුදලක් නොගෙවා මා පාඨමාලාවෙන් ඉවත් කළ හැකි බව ද මම දනිමි.

I do hereby certify that the information furnished above is true and correct and confirm to the qualifications laid in the advertisement and I have not registered for Full Time Degree or Diploma in a University or any other Government Academic Institutions. I hereby state that I am prepared to accept discontinuance from the training programme without any claim for compensation, if any of the above information is found to be false or inaccurate even after the commencement of the training programme.

————,
අයදුම්කරුගේ අත්සන.
Signature of Applicant.

දිනය/Date :————.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා for office use only

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

*ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය*
*ඉංජිනේරු තාක්‍ෂණ ආයතනය (පෙර තාක්‍ෂණඥයින් පුහුණු කිරීමේ ආයතනය) - කටුනායක*

ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලව සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම - 2011 කණ්ඩායම

අයදුම්පත පිරවීම සඳහා අයදුම්කරුවන්ට උපදෙස් :

01. *ගැසට් දැන්වීමෙහි* දක්වා ඇති පරිදි අයදුම්පත, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ කාර්යාලයකින් ලබාගත් අයදුම් පත්‍රයක් හෝ (www.iet.edu.lk) වෙබ් අඩවියෙන් ලබාගත් ආකෘතිය අනුව සකස් කරගත් අයදුම්පත්‍රයකින් ඉල්ලුම් කළ හැකිය. වෙනත් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

02. *ගැසට් දැන්වීමෙහි* සඳහන් සියළු සුදුසුකම් නොමැති අයදුම්කරුවෙකු අයදුම් කිරීමට අවශ්‍ය නැත.

03. අයදුම්පත පැහැදිලිව පිරවිය යුතු අතර, එය අයදුම්කරුගේ පැහැදිලි ඉංග්‍රීසි අත් අකුරෙන් විය යුතුය.

04. *(අ)* අයදුම්පත රු. 100 ගෙවා මිලදී ගන්නා සෑම අයදුම්කරුවෙකු විසින්ම රු. 500 ක මුදලක් මහජන බැංකු ශාඛාවක් වෙත ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පත සමග එවිය යුතුය.

*(අ.)* (1) අයදුම්පත වෙබ් අඩවියෙන් ලබා ගන්නා සෑම අයදුම්කරුවකු විසින්ම රු. 600ක මුදලක් ගෙවිය යුතුවේ. මෙම මුදල දිවයිනේ පිහිටි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවා රිසිට් පත අයදුම්පත සමඟ එවිය යුතු වේ.

*(ආ)* මුදල් තැන්පතු තුණ්ඩුව පහත සඳහන් කරුණු සහිතව නිසි පරිදි සම්පූර්ණ කළ යුතුය :-

(i) ශාඛා අංකය සහ ගිණුම් අංකය - 276-1-001-2-4535909

(ii) *බැර උපදෙස්* - මහජන බැංකුව, කටුනායක, ඉංජිනේරු තාක්‍ෂණ ආයතනයේ රැස් කිරීමේ ගිණුම් අංක : 276-1-001-2-4535909ට බැර පිණිස

(iii) අයදුම්කරුගේ නම සහ ලිපිනය :

*(ඇ)* නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමඟ මුදල් ගෙවීම් කරන ලද බැංකු ශාඛාවේ බලයලත් නිලධාරිවරයෙකු විසින් සහතික කරන ලද මුදල් තැන්පතු රිසිට් පත සමග 2011 ජුනි 18 වැනි දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්‍ෂ/විදුහල්පති, ඉංජිනේරු තාක්‍ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

*සැළකිය යුතුයි .-* අයදුම්පතෙන් විමසා ඇති සෑම කරුණක්ම නිසි පරිදි සම්පූර්ණ කළ යුතු අතර, කිසිදු කරුණක් සඳහා හිස් අවකාශ නොතිබිය යුතුය.

04-701

---

**ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව**
**(යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය)**

ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් ඇතුළත් කර ගැනීම - 2011 වර්ෂය

2011 වර්ෂය සඳහා ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයට ඇතුළත් කර ගැනීමට පහත සඳහන් අවම සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ :-

1. *(අ) වයස* : 2011.03.31 වැනි දිනට අවුරුදු 16ත් 22ත් අතර විය යුතුය.

*(ආ) අධ්‍යාපන සුදුසුකම්* :
අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී (අධ්‍යයන මාධ්‍ය අනුව) සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06ක් එකවර සමත්වීම.

*විශේෂ කුසලතා* : විදුලි/විද්‍යුත්/යාන්ත්‍රික යන ක්ෂේත්‍රයකින් නව නිර්මාණ ඉදිරිපත් කර නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පවත්වන පළාත් මට්ටමේ තරගවලින් ප්‍රථම ස්ථාන 3 අතරට පැමිණ සහතික ලබා ඇති හෝ ජාතික මට්ටමේ තරගවලින් කුසලතා සහතිකයක් හෝ ඊට ඉහල ජයග්‍රහණයක් ලබා ඇති අය ඉහත (ආ) සුදුසුකම දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්පූර්ණ කිරීම ප්‍රමාණවත්ය.

*(ඇ) සැ. යු.* .- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමග වසර 03ක් හෝ ඊට වැඩි කාලයකට දැනට ගිවිසුම්ගත අය මේ සඳහා ඉල්ලුම් නොකළ යුතුය.

2. *පාඨමාලා මාධ්‍යය* :
සියලුම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වන අතර මෝටර් කාර්මික ශිල්පය පමණක් දෙමළ මාධ්‍යයෙන් ද පැවැත්වේ.

3. *ඇතුළත් කර ගැනීමේ පරීක්ෂණය :*
අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති හා අංක 4 හි සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

*(අ) පවත්වන මාධ්‍යය :* සිංහල හා දෙමළ භාෂාවලින්

*(ආ) විභාග මධ්‍යස්ථාන :* කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුරය, ත්‍රිකුණාමලය සහ යාපනය (ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති මධ්‍යස්ථානවලින් ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් ආසන්නම මධ්‍යස්ථානයට යොමු කරනු ඇත.)

*විභාගයට අදාල විෂයයන් :*

ඇතුලත්වීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වන අතර ගණිතය, සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය සහ කාර්මික ඇඳීම යන විෂයයන් පදනම් කර සකස් කරනු ලැබේ.

4. *විභාග ගාස්තු* .- විභාග ගාස්තු වශයෙන් රු. 400ක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් පහත ගිණුමට බැර කර ලදුපත අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය :-

*ගිණුම :* ගණකාධිකාරී, ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය,
ලංකා බැංකුව, මොරටුව ශාඛාව, ගිණුම් අංක 681490

විභාග ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සිය අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුලත්වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

5. මූලික තෝරාගැනීම :
ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් ප්‍රමුඛතා පදනම මත සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්‍ෂණයට අයදුම්කරුවන් කැඳවීමේ දී අඩු පහසුකම් සහිත පළාත් සඳහා තෝරා ගැනීමේ ලකුණු මට්ටම ආයතනය මගින් තීරණය කරනු ඇත. (අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ).

6. *අවසන් තෝරා ගැනීම :*
යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ඉහළම ලකුණු ප්‍රමාණය මත අවසන් තෝරා ගැනීම සිදු කරනු ඇත. ලකුණු ලබා දෙනු ලබන්නේ යෝග්‍යතා පරීක්ෂණය සඳහා 40%ක් ද සම්මුඛ පරීක්ෂණය සඳහා 60%ක් ද වශයෙනි. විෂය බාහිර කුසලතා කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට යටත්ව පුහුණුව සඳහා බඳවා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අයදුම්කරුවන් පුහුණුවෙන් ඉවත් කරනු ලබන බව සැලකිය යුතුය.

7. *පුහුණු පාඨමාලා :*

| | |
|---|---|
| මෝටර් කාර්මික ශිල්පය | අවු. 04 |
| මිල්රයිට් වැද්දුම් ශිල්පය | අවු. 04 |
| වායු සමීකරණ/ශීතකරණ ශිල්පය | අවු 03 1/2 |
| බල විදුලි ශිල්පය | අවු 03 1/2 |
| යන්ත්‍රණ ශිල්පය | අවු 03 1/2 |
| ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පය | අවු 03 |
| වාහන විදුලි ශිල්පය | අවු 03 |
| පෑස්සුම් ශිල්පය | අවු 03 |
| මෝටර් වාහන, බොඩි අළුත්වැඩියාකරු හා පින්තාරුකරු | අවු 03 |

මෙම පුහුණු පාඨමාලා හැදැරීමට අවස්ථාව ලබා දෙනුයේ ප්‍රථම වසරේ දී මූලික පුහුණු පාඨමාලාව අවසානයේ පැවැත්වෙන වෘත්තීය තෝරා ගැනීමේ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවන්ගේ ප්‍රතිඵල අනුවය.

8. *ගිවිසුම් අත්සන් කිරීම :*
ආයතනයේ පුහුණුවට තෝරාගනු ලබන සියලුම අයදුම්කරුවන් ලැබෙන වෘත්තීන්ට අදාලව අවු 04, 3 1/2 සහ 3 ක් වූ පාඨමාලා සාර්ථකව හදාරන බවට මෙම ආයතනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමග ගිවිසුමකට එළඹිය යුතුය.

ඊට අමතරව ආයතනීය සාර්ථක පුහුණුවෙන් පසු වසර 02ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන බවට ආයතනය සමග බැඳුම්කරයකට අත්සන් තැබිය යුතුය.

9. *අයදුම්පත්* :
පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A 4 ප්‍රමාණයට තම අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර අයදුම්පත්‍රය සමග පහත දැක්වෙන සහතිකවල ඡායා පිටපත් ද අමුණා එවිය යුතුය :-

*(අ)* උප්පැන්න සහතිකය,
*(ආ)* අධ්‍යාපන සහතික,
*(ඇ)* ඉහත අංක 1 හි විශේෂ කුසලතා යටතේ අයදුම් කරන අයදුම්කරුවන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් නිකුත් කර ඇති පළාත්/ජාතික මට්ටමේ සහතිකය.

අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ ඉහත වම් කෙළවරේ "පූර්ණ කාලීන ආධුනිකයින් බඳවා ගැනීම - 2011" යනුවෙන් සඳහන් කළ යුතුය. (අයදුම්පත් www.cgtti.slt.lk දරන ආයතනීය වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකිය)

10. *අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය :*
අයදුම්පත් 2011.06.14 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ කළමනාකාර - මානව සම්පත් හා පරිපාලන වෙත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය :-

කළමනාකාර - මානව සම්පත් හා පරිපාලන
ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය
අංක 582, ගාලු පාර,
ගල්කිස්ස,
(අඟුලාන හංදිය අසල)
දුරකථන අංකය : 0112-605625

**ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය – මොරටුව**

***ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් ඇතුළත් කර ගැනීම – 2011 වර්ෂය***

01. *(අ)* සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

(ඉංග්‍රීසියෙන්) :————.

*(ආ)* මුලකුරු සමග නම :————.

02. (අ) තැපැල් ලිපිනය (ඉංග්‍රීසියෙන්) :————.
(ආ) දිස්ත්‍රික්කය :————. (ඇ) පළාත :————.

03. (අ) උපන් දිනය :————.
(ආ) 2011.03.31 දිනට වයස :
අවු. :————. මාස :————. දින :————.
(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය :————.

(ඈ) දුරකථන අංකය :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

05. අධ්‍යාපන සුදුසුකම් (අ. පො. ස. සාමාන්‍ය පෙළ) :

| පළමු වර | | දෙවන වර (විශේෂ කුසලතා යටතේ ඉදිරිපත් වන අයදුම්කරුවන් සඳහා පමණි) | |
|---|---|---|---|
| විභාග අංකය :—— | වර්ෂය :—— | විභාග අංකය :—— | වර්ෂය :—— |
| *විෂයයන්* | *සාමාර්ථය* | *විෂයයන්* | *සාමාර්ථය* |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |

06. විශේෂ දක්ෂතා යටතේ අයදුම් කරන්නේ නම් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂම මගින් නිකුත් කළ පළාත්/ජාතික මට්ටමේ සහතිකය නිකුත් කළ වර්ෂය හා ක්ෂේත්‍රය :————.

07. (අ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍යය :————.
(ආ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති විභාග මධ්‍යස්ථානය :————.
(කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුරය, ත්‍රිකුණාමලය හා යාපනය)

08. (i). මුදල් ගෙවූ ලංකා බැංකු ශාඛාවේ නම :————.
(ii). මුදල් ගෙවූ දිනය :————.

09. ඉහත සඳහන් කර ඇති විස්තර සත්‍ය බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් විස්තරවලින් යමක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව මා තෝරා ගැනීමට පෙර හෝ තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හැකි බව දනිමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

04-700

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.